මිනිසුන් සිකුරාදා දින නැමදුම නොසළකා හැරීමෙන් වැළකී සිටිය යුතුයි. එසේ නැතහොත් අල්ලාහ් ඔවුන්ගේ හදවත් මත මුද්රා තබනු ඇත. පසුව ඔවුන් නොසලකා හරින ලද පුද්ගලයින් අතරට පත්වනු ඇත

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තම වෙදිකාව මත සිට ප්රකාශ කළ බවට අබ්දුල්ලාහ් ඉබ්නු උමර් සහ අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හුම්) යන උතුමන්ලා විසින් මෙසේ වාර්තා කරන ලදී: "මිනිසුන් සිකුරාදා දින නැමදුම නොසළකා හැරීමෙන් වැළකී සිටිය යුතුයි. එසේ නැතහොත් අල්ලාහ් ඔවුන්ගේ හදවත් මත මුද්රා තබනු ඇත. පසුව ඔවුන්
නොසලකා හරින ලද පුද්ගලයින් අතරට පත්වනු ඇත." [صحيح] [رواه مسلم]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ මින්බර් වේදිකාව මත සිට මෙසේ අවවාද කළහ. "කවරෙකු ජුමුආ සලාතය කිසිදු හේතුවකින් තොරව නොසැලකිලිමත්කමින් හා මැලිකමින් අත් හරින්නේ ද මඟ හරින්නේ ද එවන් අයට එතුමාණෝ අවවාද කළේය. එසේ ඔවුන් සිදු කළේ නම් ඔවුන්ගේ හදවත් මත අල්ලාහ් මුද්රා තබයි. ඒවා ආවරණය කරයි. සත්යය පිළිපැදීම වළක්වාලමින් ඒ මත තිරයක් ඇති කරයි. පසුව ඔවුන් යහපත් හේතු කාරණා නොසලකා හරින පුද්ගලයින් බවට පත්වන අතරම නැමදුම් කටයුතුවලින් හුදෙකලා වන තත්ත්වයට පත්වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/65767